*සැ. යු.-* 2018.02.16 දින පළ වූ අංක 2,059 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,060 - 2018 පෙබරවාරි මස 23 වැනි සිකුරාදා - 2018.02.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 106 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 107 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 මාර්තු මස 16 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මාර්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

### ගම්පහ දිසා අධිකරණයේ දී ය

| | | |
|---|---|---|
| නඩු අංකය | : | 106/DR |
| ස්වභාවය | : | ණය අයකර ගැනීම |
| වටිනාකම | : | රු. 4,307,389.83 |
| ක්‍රියා පටිපාටිය | : | 1994 අංක 9 දරන පනතින් සංශෝධිත 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ ක්‍රියා පටිපාටිය අනුව |
| පිස්කල් අංකය | : | 122/2017 |

1994 අංක 9 දරන පනතින් සංශෝධිත 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් හා සම්බන්ධ කාරණය පිළිබඳවයි.

මහනුවර යටිනුවර වීදියේ අංක 106 හි තම ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති සහ/හෝ ගම්පහ - මංගල මාවත, අංක 6 දරන ස්ථානයේ ශාඛා කාර්යාලය පවත්වාගෙන යන සීමාසහිත කොමර්ෂල් ක්‍රෙඩිට් පී එල් සී ලෙස සංස්ථාපිතව තිබූ දැනට කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී එල් සී.

...................................*පැමිණිලිකාර සමාගම.*

*එදිරිව*

1) චූලිකා තුෂාරි පෙරේරා රාජපක්ෂ අංක 68/24 - ඉසුරු මාවත, ගම්පහ
2) ඉඳුනිල් රන්මලී පෙරේරා රූපසිංහ, අංක 4, තිස්ස පාර,, ගම්පහ
3) සංගපාල ආරච්චිගේ දොන් දිමුත් ප්‍රගීත් දිසානායක, අංක 91, කිදගහ මුල්ල, ගම්පහ
4) කෙනත් හර්බට් මෙන්ඩිස්, අංක 68/24, ඉසුරු මාවත,, ගම්පහ

.............................................*විත්තිකරුවන්.*

මෙම නඩුවේ වාර්තාගත කර ඇති වර්ෂ 2017 ක්වූ ජුනි මස 30 වැනි දිනැති තීන්දු ප්‍රකාශය අනුව ඉහත කී විත්තිකරුවන් විසින් පැමිණිලිකාර සමාගමට ගෙවිය යුතු රුපියල් හතලිස්තුන් ලක්ෂ හත් දහස් තුන්සිය අසූනවයයි ශත අසූ තුනක (රු. 4,307,389.83) මුදලද එකී මුදල මත තීන්දු ප්‍රකාශයේ දින දක්වා 3%ක පොලියක් ද තීන්දු ප්‍රකාශිත දින සිට තීන්දු ප්‍රකාශිත සම්පූර්ණ මුදල මත අදාළ නෛතික පොලිය ද නඩු ගාස්තුද විත්තිකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා මා විසින් වර්ෂ 2017/12/05 වැනි දින තහනමට ගන්නා ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ මෙම නඩුවේ 2017/11/10 දිනැති නියෝගය අනුව වර්ෂ 2018 ක්වූ මාර්තු මස 28 වැනි දින පස්වරු 2.30 ට දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*දේපල පිහිටීම.-* ගම්පහ දුම්රියපොලේ සිට ගම්පහ යක්කල පාරේ ඉස්පිරිතාල හන්දිය දෙසට මීටර් 600 ක් පමණ යනවිට වම් පසින් පිහිටි විජේරාම පාරෙන් හැරී මීටර් 200 ක් පමණ දුරින් කහ පැහැති තීන්ත ආලේපිත පැරණි ආකාරයේ නිවසක් සහිත මෙම ඉඩම දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් (i) ගැණුම් මිලෙන් 25% ක්ද (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාරව පිස්කල්ගේ ගාස්තුද (iii) විකුණුම් සඳහා වන සියළුම වියදම්ද මුදලින් ගෙවිය යුතු ය. තවද, ගැණුම් මිලෙන් ඉතිරි 75% ක්වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

### උපලේඛනය

ප්‍රසිද්ධ නොතාරිස් ඩයනා වීරසිංහ විසින් වර්ෂ 2015/02/20 දින ලියා සහතික කළ අංක 24 දරන ඔප්පුව පිට අයිතිව නිරවුල්ව භුක්ති විඳගෙන එන බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ ගම්පහ මහ නගර සභා සීමාවේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 223/සී මැදගම 4 ග්‍රාම නිලධාරී වසමේ ගම්පහ - මැදගම විජයාරාම පාරේ පිහිටි කුණුකැටියේ පිල්ලෑව නමැති ඉඩමේ ලොට් ඒ දරන බිම් කොටස නැවත මැන දක්වන ලද කේ. ඒ. පී. කස්තුරිරත්න බලයලත් මිනින්දෝරුතැන විසින් මැන සාදන ලද අංක 4064 සහ වර්ෂ 2005.05.13 දිනත් දරන පිඹුරේ ප්‍රකාර බෙදා වෙන්කළ අංක 36 දරන බිම් කොටසට මායිම්.

| | | |
|---|---|---|
| උතුරු නැගෙනහිරට | : | කඩුවැටියේ ලන්ද ද, |
| දකුණු නැගෙනහිරට | : | වරිපනම් අංක 36/3 දරන මෙම ඉඩමේ ලොට් බී දරන කොටස ද, |
| දකුණු බස්නාහිරට | : | අඩි 10ක් පළල පාරක් සඳහා වෙන්කළ කොටස ද, |
| උතුරු බස්නාහිරට | : | විජයාරාම පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතයි දශම පහක් (අ.0 රූ.0 පර්. 17.5) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි නිවස ඇතුලු ගහකොළ, පළතුරු ආදී සියලු දේත් සමග වේ. |

ඒ. එච්. අදිකාරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් සහ ප්‍රොබේට් නිලධාරි,
දිසා අධිකරණය - ගම්පහ.

වර්ෂ 2018 ක් වූ පෙබරවාරි මස 06 වැනි දින දී ය.

02-737

---

# විවිධ දැන්වීම්

## සිරි සෙත අධ්‍යාපනික හා සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

දිලුම් අමුණුගම වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "සිරි සෙත අධ්‍යාපනික හා සංස්කෘතික පදනම'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

1. පාසල් ළමුන් සඳහා අභිප්‍රේරණ වැඩසටහන් තුළින් ඔවුන් සංවේදී කිරීම ;
2. රටේ සමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගි වීම ;
3. විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම,

යනාදිය වේ.

දිලුම් අමුණුගම,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

02-798

---

## පුණර්වාල්වුක් කළකම් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

එම්. මුජිබුර්රහ්මාන් වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 48 දරන ස්ථාවර නියෝගය යටතේ "පුණර්වාල්වුක් කළකම්'' සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

1. පාසල් ළමුන් සඳහා අභිප්‍රේරණ වැඩසටහන් තුළින් ඔවුන් සංවේදී කිරීම ;
2. රටේ සමාජයීය, සංස්කෘතික හා ආර්ථික සංවර්ධනයට සහභාගි වීම ;
3. විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම,

යනාදිය වේ.

එම්. මුජිබුර්රහ්මාන්,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

02-799

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.